# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1918/20 - 2015 ජුනි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2015.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක. 55.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියාකරමින්, පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ විකිණීමේදී හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමේදී හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීමේදී අදාළ භාණ්ඩයේ හෝ ඇසුරුමෙහි පැහැදිලි ලෙස පහත සඳහන් තොරතුරු අඩංගු විය යුතු බවට අදාළ භාණ්ඩ නිෂ්පාදකයින් හා වෙළෙඳුන් වෙත මෙයින් විධාන කරනු ලැබේ.

1. භාණ්ඩයේ උපරිම සිල්ලර මිල
2. නිෂ්පාදකයාගේ හෝ ආනයනකරුගේ ලිපිනය හා දුරකථන අංකය
3. නිෂ්පාදිත දිනය

**ඉහත සඳහන් උපලේඛනය**

i. අටපිරිකර
ii. තනිපට සිවුර, දෙපට සිවුර සහ අඳනකඩය
iii. පාත්‍රය
iv. බඳ පටිය

මෙම විධානය වර්ෂ 2015 නොවැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2015 ජුනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

06 - 762


1A - PG 2506 — 206 (2015/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.